# ප්‍රතිපත්ති ප්‍රකාශනය

අති ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

ජනාධිපති

1996

BKT 0107
25.08.2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# ප්‍රතිපත්ති ප්‍රකාශනය

-6-1998

## ශ්‍රී ලංකා ජනරජයේ පාර්ලිමේන්තුව විවෘත කිරීමේ උත්සවය

**1996 පෙබරවාරි 09**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිනි
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය විසිනි.

ගරු කථානායකතුමනි,
ගරු මන්ත්‍රීතුමනි,

මෙම වසරේ මාගේ ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මෙම ගරු සභාව ඇමතීමට ලැබීම මා ලද වරප්‍රසාදයක් ලෙස සලකමි. පසුගිය වසරේ ජනවාරි මාසයේ දී සවිස්තර ප්‍රතිපත්ති ප්‍රකාශනයක්ද, ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රයේ රජයේ ප්‍රගතිය දැක්වෙන "අනාගත සංවර්ධනය සඳහා අත්තිවාරම් දැමීම - 1994/1995 ආර්ථික ප්‍රගතිය" නමැති ලේඛනය ද මෙම ගරු සභාව වෙත ඉදිරිපත් කළෙමි.

## ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් යළි ස්ථාපිත කිරීම

මගේ මුල් ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කළ පරිදි "නීතියේ ආධිපත්‍ය තදින්ම මුල් බැසගත් ප්‍රජාතන්ත්‍රවාදය සැබවින්ම ක්‍රියාත්මක වන" සමාජයක් ගොඩනැගීමට මගේ රජය ඇපකැපවී සිටී. ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපිත කිරීම සඳහා අප විසින් ඒ වනවිටත් ගෙන තිබූ වැදගත් පියවර කීපයක් මම එහි සඳහන් කළෙමි. ගත වූ වසරේ ඒ අරමුණු පෙරදැරිව තවත් බොහෝ දේ කළෙමු.

ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්ම යටපත් කෙරෙන අන්දමේ හදිසි නීති අප විසින් ඉවත් කරන ලදී. එම හදිසි නීති අප විසින් යොදගත්තේ ඒවා අත්‍යවශ්‍යම වූ අවස්ථාවලදී පමණි. හදිසි නීතිය මගින් රට පාලනය කිරීම නිමාවට පත් කළෙමු. රටේ එක් කොටසක යුද්ධමය කටයුතු උත්සන්න කිරීමට සිදුවීමේ හේතුවෙන් පැන නැගුන අර්බුද ගණනාවක්ම, හදිසි නීතිය නොයොද මැනවින් පාලනය කිරීමට

මගේ රජය සමත් විය. හදිසි නීතිය යොදා ගැනීම අවශ්‍ය වූයේ නම් අප එසේ කළේ කෙටි කාලපරිච්ඡේද කීපයක දී පමණි. තෙල් ටැංකි සංකීර්ණයේ ඇති වූ ගින්න ද, මෑතකදී කොළඹ කොටුවේ සිදුවූ බෝම්බ පිපිරීම ද හදිසි නීතිය ප්‍රයෝජනයට නොගත් අවස්ථා කීපයකට නිදසුන් වේ.

පුද්ගලයන් අත් අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් දුන් නිශ්චිත උපදෙස් නිසා මීට අවුරුදු කීපයකට ඉහත දී අත්දුටු අත්තනෝමතික ක්‍රියා වැළැක්විණ. මානව හිමිකම් පිළිබඳ කාර්ය සාධක බලකායට අළුතින් සාමාජිකයන් පත් කිරීමත්, නීති විරෝධී ලෙස පැහැරගෙන යනු ලැබූ පුද්ගලයන් පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා ජනාධිපති කොමිෂන් සභා පත් කිරීමත් මානව අයිතිවාසිකම් රැකීමට ගත් පියවර වේ.

ගතවූ දශක දෙක තුළ අප සමාජය පුරා පැතිරී තිබුණු අහිතකර බලවේගවලට ප්‍රජාතාන්ත්‍රික ක්‍රමයේ අත්‍යවශ්‍ය අංශය වන මැතිවරණ ක්‍රියාදමය ද ගොදුරු විය. මැතිවරණ සම්බන්ධයෙන් පැන නැගුණු සාහසික ක්‍රියා ගැන පරීක්ෂා කිරීමටත්, එම සාහසික ක්‍රියාවලින් හානි සිදු වූ අයට වන්දි ගෙවීමටත් අපි කටයුතු කළෙමු.

ජනාධිපති තනතුරට හිමි අත්තනෝමතික බලතල පාවිච්චි කිරීම මගේ රජය විසින් ප්‍රතික්ෂේප කිරීම මගින් ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපිත කිරීමත් එය මනාව පවත්වාගෙන යෑමත් සහතික කළෙමු.

## අල්ලස. දූෂණ හා නාස්තිය පිටු දැකීම

ශ්‍රී ලංකාවේ පොදු ජන ජීවිතයට අදාළ ක්ෂේත්‍රයන්හි දූෂණ සහමුලින් ඉවත් කිරීමේ කාර්ය අරඹා ඇති බවත් එසේ කිරීමට අප විසින් සාමූහික වූත් නොපසුබස්නා වූත් උත්සාහයන් නොගතහොත් අපේ සමාජ සංස්ථාවන්හි පදනම දෙදරා යන බව අපේ දැඩි විශ්වාසය බවත් මගේ මුල් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කළෙමි.

අල්ලස, දූෂණ හා නාස්තිය අප සමාජයට මරොත්තු නොදෙන මට්ටමක ඉහවහා ගොස් තිබිණ. රාජ්‍ය අංශයේ ආයතන පිළිබඳවත්, රාජ්‍ය පරිපාලන ව්‍යුහය පිළිබඳවත් ජනතාවගේ

විශ්වාසය කඩවීමට මේ තත්වය හේතු විය. සමාජ සංස්ථාවන් කෙරෙහි මහජනයාගේ නැතිවූ විශ්වාසය යළි ගොඩනැගීමට පොදු පෙරමුණු රජය විසින් උපරිම ප්‍රමුඛත්වය දෙනු ලැබීය. කොයි අන්දමින් බැලුවත් මෙය පහසු කාර්යයක් නොවේ. සමාජයේ මුල් බැසගෙන තිබූ මේ ව්‍යාධි සෘෂනිකව සුවකළ හැකි ක්ෂනික පිළියමක් නැතිනම් "කෝකටත් තෛලයක්"නැත. මේ සඳහා රජය විසින් ගනු ලැබූ මුල් පියවර නම් අල්ලස් හා දූෂණ පිළිබඳව සම්පූර්ණයෙන්ම ස්වාධීන කොමිෂමක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා ඉදිරිපත් කිරීම මගින් ඒ සඳහා වූ අපේ දැඩි අධිෂ්ඨානය ප්‍රදර්ශනය කිරීමයි. අල්ලස් මර්දන කාර්යය ඵලදායී අන්දමින් ඉටු කිරීමට අපොහොසත් වූ අල්ලස් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙනුවට දේශපාලන බලපෑමෙන් සම්පූර්ණයෙන්ම නිදහස් ආයතනයක් ස්ථාපිත කළ අතර මෙම නව නීතිය මගින් අල්ලස් හා දූෂණ ගැන පරීක්ෂා කිරීමේ හා නඩු පැවරීමේ සම්පූර්ණ බලතල ඊට හිමිකර දී ඇත. රාජ්‍ය ආයතනවල බලතල අයුතු ලෙස යොදා ගන්නා බලධාරීන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගත හැකි පරිදි දූෂණ සම්බන්ධව අලුත් නීතිමය නිර්වචනයක් මෙමගින් ඉදිරිපත් කෙරිණ. මහජන ඡන්දයෙන් තේරී පත්වූ අයට විරුද්ධව දූෂණ සම්බන්ධයෙන් නඩු පැවරීමට මෙතෙක් තිබූ රීතිමය බාධා ඉවත් කරන ලදී. පරිපාලන ව්‍යුහය සම්බන්ධයෙන් මහජනතාවගේ බිඳුනු විශ්වාසය යළි ගොඩ නැංවීම සඳහා රාජ්‍ය නිලධාරීන් තුල අවංකභාවය පිළිබඳ හැඟීම මුල් බැස ගැන්වීමට ද අප බලාපොරොත්තු වෙමු. විශ්වාසය හා වගකීම් පැවරී ඇති පුද්ගලයන් විසින් තම බලය අනිසි ලෙස යොදා ගෙන දූෂණ අක්‍රමිකතාවල යෙදීම මෙම රජය කිසිසේත්ම නොඉවසන බව පැහැදිලිව ප්‍රකාශ කිරීමේ එක් පියවරක් ලෙස රාජ්‍ය අංශයේ දූෂණ හා අක්‍රමිකතා සෙවීමේ ජනාධිපති කොමිෂම පිහිටුවීම හැඳින්විය හැකිවේ.

ස්වාධීනව තීරණ ගැනීමට සමත් අවංක හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ඇති කිරීමට රජය විසින් පියවර ගනු ඇත. රාජ්‍ය නිලධාරීන් දිරිගැන්වීම සඳහා දිරි දීමනා ක්‍රමයක් ද හඳුන්වා දෙනු ඇත.

මහජන මුදල් නාස්තිකාරී ලෙස වියදම් කිරීම අඩු කිරීමට රජය විසින් පියවර ගනු ලැබීය. ඇමති මට්ටමේ හෝ ඒ හා සමාන විධායක මට්ටමේ තනතුරු සංඛ්‍යාව අඩු කළෙමු. මහජනයාට සහනයක් සිදුනොවී හුදෙක්ම පාලක පක්ෂයේ ප්‍රසිද්ධිය හා ජනප්‍රියතාව තහවුරු කිරීමේ අදහසින් පැවැත්වූ නොයෙක් අන්දමේ උත්සව වෙනුවෙන් මුදල් නාස්ති කිරීම නවතා ඇත.

යුද කටයුතු සම්බන්ධයෙන් වූ වියදම් දැරීමේ දී අප අනුගමනය කළ පිළිවෙත, සංයමයෙන් යුතුව රජයේ මුදල් වැය කිරීමට ගත් උත්සාහය පිළිබඳ හොඳම නිදසුනකි. අතීතයේ දී යුද්ධෝපකරණ වෙනුවෙන් විශාල වියදම් කළ බව කියතත් ඇත්ත වශයෙන් ම සිදු වී ඇත්තේ එකී මුදල් සම්භාරයෙන් විශාල කොටසක් දූෂණය තුලින් අපතේ යැවීමයි. අපේ වීරෝධාර රණවිරුවන්ගේ අප්‍රතිහත ධෛර්යය තිබුණත් ඔවුන්ට අවශ්‍ය නියම යුද්ධෝපකරණ නොතිබූ නිසා සටන් පෙරමුණේ සැලකිය යුතු ප්‍රගතියක් ලබාගැනීමට එද නොහැකි විය. මේ රජය යටතේ මේ තත්ත්වය මුළුමනින්ම වෙනස් කෙරුණි. යුද්ධෝපකරණ මිල දී ගැනීමට වැය කළ මුදල් උපරිම ඵල ලැබෙන ලෙස වැය කොට අවශ්‍ය සියළුම යුද්ධ උපකරණ හමුදාවලට අපි ලබා දුනිමු.

දූරදර්ශී දේශපාලන නායකත්වයක් යටතේ මැනවින් සැලසුම් කරන ලද උපාය මාර්ග අනුගමනය කරමින් සටන් කළ අපේ හමුදාවන් ශ්‍රී ලංකාවට ගෞරවයක් අත්කර දෙන අන්දමේ ජයග්‍රහණයක් ලැබූහ.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ

පොදු පෙරමුණේ තවත් ප්‍රතිඥාවක් වූයේ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුළුමනින්ම සංශෝධනය කරන බවයි. 1978 සම්මත කරගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ස්වභාවය අතින්ුත්, එහි අඩංගු විධිවිධාන අනුවත් එය ඒකාධිපති ස්වරූපයක් දැරීය. එම ව්‍යවස්ථාවෙන් සීඝ්‍ර ආර්ථික සංවර්ධනයකට අවශ්‍ය පසුබිම නොසැපයුනා පමණක් නොව එමගින් පොදුජන අපේක්ෂාවන්ද පිළිබිඹු නොවීය. එබැවින් එම ව්‍යවස්ථාවෙන් ගොඩ නැගුනු

ඒකාධිපති ව්‍යුහය සිදබිඳ දැමීම අපගේ මූල් ප්‍රමුඛතාවය විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් වූ පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවක් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය අප බලයට පත් විගසම ආරම්භ කළෙමු. මහජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත්ව ආ දේශපාලන පක්ෂවල එකගතාවය ඇතිව අළුත් ව්‍යවස්ථාව සම්පාදනය කිරීමට අපි අදහස් කරමු. පොදු මහජනතාවගේත්, වෘත්තීමය සංවිධානයන්ගේත්, රාජ්‍ය නොවන සංවිධාන හා මේ කරුණ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන වෙනත් සංවිධානවලද අදහස් විමසනු ලැබූ අතර ඔවුන්ගෙන් ලැබුණු ප්‍රතිචාරය අතිශයින් දිරිගන්වන සුළුය. මේ අදහස් සියල්ල සැලකිල්ලට ගෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙටුම්පත් කරන ලද අතර එය අපේ ජනතාවගේ අපේක්ෂාවෙන් පිළිබිඹු කෙරෙන දිගුකල් පවත්නා සජීවී ව්‍යවස්ථාවක් වනු ඇත. එක් අතකින් බලනවිට අප පක්ෂයට 2/3 බහුතරයක් නොතිබීමේ වාසියක් ද ඇත. මන්දයත්, අනෙකුත් පක්ෂ සමග නිරතුරුව කෙරෙන සාකච්ඡා තුලින් අලුතෙන් පනවනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සියළුම පක්ෂවලට පිළිගත හැකි දිගුකල් පවත්නා එකක් වනු ඇත.

බලතල පැවරීම සඳහා වූ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කෙරෙනු ඇත. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් විධායක ජනාධිපති තනතුර හුදෙක් සම්ප්‍රදායික රාජ්‍ය නායක තනතුරක් බවට පත් කෙරෙනු ඇත. එමගින් පාර්ලිමේන්තුවේ සෛවරීභාවය යළි ස්ථාපිත කරනු ඇත. මූලික අයිතිවාසිකම් පිළිබඳ නව පරිච්ඡේදයෙන් මෙතෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අන්තර්ගත නොවූ මූලික අයිතිවාසිකම් කීපයක් හඳුන්වා දෙනු ඇත. රාජ්‍ය තන්ත්‍රයේ ඇතැම් අතිශය වැදගත් තනතුරු දරන්නන් හට ස්වාධීනව කටයුතු කිරීම එමගින් සහතික කෙරේ. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳ වූ අපේ උත්සාහය හීන වී නැත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් යම් අංශවලට පමණක් සීමා වන සංශෝධන කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් කළ යුතු පූර්ණ සංශෝධනයට බාධා විය හැකි යැයි අපි සිතමු.. වර්තමාන ජනාධිපති ධූරය වැනි තනතුරක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විවිධ ලක්ෂණ කෙරෙහි ඉමහත්

බලපෑමක් ඇති කෙරේ. සෙවරි පාර්ලිමේන්තුවක් වෙත පූර්ණ බලතල පැවරීමකින් තොරව ජනාධිපති තනතුර අහෝසි කිරීමෙන් බලතල සම්බන්ධයෙන් යම් යම් අඩුපාඩු හෝ ඌනතාවයන් ඇතිවිය හැකි අතර ඉන් සිදුවන්නේ තත්ත්වය යහපත් අතට හැරීම නොව තවත් අයහපත් අතට හැරීමයි. 1978 ඇති කරන ලද ඒකාධිපති ස්වරූපයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යටතේ අප කටයුතු කරන නමුත් මෙරටේ පොදු ජනතාව විසින් අප වෙත තැබූ විශ්වාසය කඩවන අන්දමට එකී ව්‍යවස්ථාවේ බලතල අනිසි ලෙස යොදා නොගත් බව අපට ආඩම්බරයෙන් කිව හැක. මෙම රජය විසින් හෝ ජනාධිපතිවරිය විසින් හෝ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල කිසි විටෙක අනිසි ලෙස ප්‍රයෝජනයට ගෙන නොමැත.

## යුද්ධය හා වාර්ගික අර්බුදයේ නිමාවක් දැකීම

ජනවාර්ගික අර්බුදය සම්බන්ධයෙනුත්, උතුරු නැගෙනහිර යුද්ධය සම්බන්ධයෙනුත් අපේ ප්‍රතිපත්තිය මුල සිටම අප ඉතා පැහැදිලිවත්, එඩිතර ලෙසත් ප්‍රකාශ කළෙමු. මම මේ කරුණ සම්බන්ධයෙන් මෙම ගරු සභාවේ මෙසේ සඳහන් කළෙමි.

"ශ්‍රී ලංකාවේ සෑම ජන කොටසකටම බියෙන්, සැකෙන් තොරව ආරක්ෂා සහිතව ජීවත් විය හැකි, මනුෂ්‍යත්වය අගයන සෑම පුරවැසියකුටම එක සමානව සලකන ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ ඉදිරි දර්ශනයක් අපට තිබේ. තම අනන්‍යතාවය ප්‍රකාශ කිරීමටත්, ජාතික ප්‍රාදේශීය හෝ ග්‍රාමීය මට්ටමෙන් ජාතික ජීවිතයට එක සමානව සම්බන්ධවී දායක විය හැකි තත්ත්වයක් නිර්මාණය කිරීමටත් අවශ්‍ය නිදහස සෑම ජන කොටසකටම තිබිය යුතු යයි අප විශ්වාස කරමු. රටේ ඇති අභ්‍යන්තර අර්බුද හා අසහන විසඳීමට අපට මග පෙන්වන්නේ අවිහිංසාව හා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අප තුළ ඇති ඇපකැප වීමයි." අපි බලයට පත් වී සති කිපයක් ඇතුළත මෙම ප්‍රතිපත්තිය අනුගමනය කරමින් ගෞරවාන්විත සාමයක් උදාකර ගත හැකිය යන අපේක්ෂාවෙන් එල්ටීටීඊ සංවිධානය සමග සංවාදයක් ඇරඹීමු. ඉනික්බිතිව 1995 ජනවාරි

මස එදිරිවාදිකම් අත්හිටුවීමේ ගිවිසුමකට ද එළඹුනෙමු. සාම සාකච්ඡා ක්‍රියාවලිය මුළුල්ලේම දේශපාලන විසඳුමක් හෝ වෙනත් අන්දමේ සමථයකට පත් කිරීම සඳහා වූ රජයේ යෝජනා සලකා බැලීමට එල්ටීටීඊ සංවිධානය උපක්‍රමශීලීව ප්‍රතික්ෂේප කළේය. සාමය ඇති කිරීම සඳහා වූ රජයේ උත්සාහයන් සියල්ල සද්භාවයෙන් යුතුව කෙරුණු බව ප්‍රකටව පෙණුනි. එහෙත් එල්ටීටීඊ සංවිධානයෙන් ප්‍රතිචාරය වූයේ හෘදය සාක්ෂියට එකඟව රජයට එකඟවිය නොහැකි අන්දමේ තාත්වික නොවන ඉල්ලීම් වැඩි වැඩියෙන් ඉදිරිපත් කිරීමයි. උතුරේ වෙසෙන ජනතාවට විඳීමට සිදුවූ දුක් ගැහැට යම් තරමක් දුරට හෝ තුනී කිරීමට රජය විසින් පියවර ගණනාවක් ගනු ලැබීය. උතුරට භාණ්ඩ ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙනුත්, ධීවර කර්මාන්තය සම්බන්ධයෙනුත් පනවා තිබූ සම්බාධක ඉවත් කළෙමු. යුද්ධයෙන් විනාශ වී ගිය එම ප්‍රදේශවල සමාජ යටිතල ව්‍යුහය යළි ඉදි කිරීමත්, එදිරිවාදිකම් හේතුවෙන් වසා තිබූ මාර්ග විවෘත කිරීමටත් කටයුතු යෙදුවෙමු. එසේ වුවද එල්ටීටීඊ සංවිධානයෙන් යහපත් ප්‍රතිචාරයක් නොලැබිණ. 1995 අප්‍රේල් මස 19 දා ඇරඹූ ප්‍රහාරයෙන් එදිරිවාදිකම් නැවැත්වීමේ යුගය අවසන් විය. ගැටුම් නැවත ඇතිවීමෙන් උද්ගත වූ අනිටු ප්‍රතිවිපාක මුළු මහත් ජාතියටම විඳ දරා ගැනීමට සිදු විය. එහෙත් දේශපාලන විසඳුම් මාලාව ජනතාව වෙත ඉදිරිපත් කිරීම මෙයින් වැළකුණේ නැත. බලතල බෙදාහැරීම සඳහා වූ රජයේ යෝජනා අගෝස්තු මස 03 වන දින එළි දුටුවේය. මහජනතාවගේත්, මහජන නියෝජිතයන්ගේත් ප්‍රතිචාරය ලබාගැනීමේ අටියෙන් මෙම යෝජනාවලියට පුළුල් ප්‍රසිද්ධියක් ලබාදෙන ලදී.

රටේ ඒකීයභාවයත්, භෞමික අඛණ්ඩතාවයත්, ජාතියේ ස්වෛරීභාවයත් රැකගන්නා අතරම කලාපවලට පුළුල් මට්ටමෙන් බලතල පැවරීම පහසු කිරීම මෙම යෝජනාවලියේ තේමාවයි.

මෙහිදී ඉතා අවධාරණයෙන් කිවයුතු කරුණක් නම් රජය අපේක්ෂා කරන්නේ බලතල බෙදා හැරීම පමණක් බවයි. මෙම රජය රට බෙදීමේ කටයුත්තට කිසි විටකත් එකඟ නොවන බවයි.



3

ජනවාර්ගික අර්බුදය සමථයකට පත් කිරීම මේ යෝජනාවල එක් ප්‍රධාන අරමුණකි. කෙසේ වුවත් මෙමගින් පුළුල් අරමුණු රාශියක් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ. දිවයිනේ කවර පෙදෙසක වාසය කළත් ශ්‍රී ලංකාවේ සියළුම රටවැසියන්ට තම අනාගතය සම්බන්ධයෙන් වැදගත් වන්නා වූ තීරණ ගැනීමට අවශ්‍ය බලතල ඉන් ලැබේ. එසේ මහජනයාට තම ඉරණම තීරණය කරගත හැකි වන අන්දමට මධ්‍යම ආණ්ඩුවේ බලතල ප්‍රාදේශීය ඒකක සමඟ බෙදා ගැනීම මගින් ප්‍රජාතන්ත්‍රවාදයේ ශ්‍රේෂ්ඨ අපේක්ෂාවන් මල්ඵල ගැන්වෙනු ඇත.

යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එක් පරිච්ඡේදයක ස්වරූපයෙන් දක්වා ඇති යෝජනාවලින් ප්‍රායෝගික මට්ටමේ බලතල පැවරීමකට ඉඩකඩ සලසන අතරම ශ්‍රී ලංකාවේ ඒකීයභාවය හා ස්වෛරීභාවය තහවුරු කෙරේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවක් විසින් මෙම යෝජනා සලකා බැලීම ඊළඟ පියවරයි. තේරීම් කාරක සභාවේ එකඟතාවය ලැබීමෙනුත්, පාර්ලිමේන්තුවේ 2/3 ක බහුතරයේ අනුමැතිය ලැබීමෙනුත් අනතුරුව ජනමත විචාරණයක් මගින් මහජනතාව විසින් තවදුරටත් අනුමත කිරීමට කටයුතු සලසනු ලැබේ. මෙම රජය මහජනතාවගේම රජයක් ලෙස අප සලකන නිසාත්, ශ්‍රී ලංකාවාසී සෑම දෙනාගේම අපේක්ෂාවන් අනුව කටයුතු කරන හා ඉදිරියේදීත් කටයුතු කිරීමට බලාපොරොත්තු වන රජයක් වශයෙනුත් බලතල බෙදාහැරීම පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අන්තිම තීරණය ගැනීම මෙරට මහජනතාවට පැවරිය යුතුයයි මේ රජය තරයේ විශ්වාස කරයි.

සාහසික ක්‍රියාවල නිරතවීමෙනුත් රජයේ යෝජනාවලට හුදෙක්ම පටහැනි ප්‍රතිපත්ති අනුගමනය කිරීමෙනුත් එල්ටීටීඊ සංවිධානය අපේක්ෂා කරන මූලික අරමුණු දෙකක් ඇත. එනම්,

* රජයට සිය දේශපාලන විසඳුම් ගැන කටයුතු කිරීමට නොහැකිවන පරිදි සාම ක්‍රියාවලිය ආපසු හැරවීමත්, ජනවාර්ගික කොටස් අතර වෛරය හා සැකය වර්ධනය කිරීමත්, හා
* එල්ටීටීඊ සංවිධානයට විරුද්ධව කරගෙන යන යුද්ධමය ක්‍රියාදාමයෙන් හමුදාවන් වෙනතකට යොමු කරවීම මගින් එල්ටීටීඊ සංවිධානයට අවසානයේ දී ලැබෙන්නට යන පරාජය තව තවත් කල් දැමීමත්ය.

උතුරේ හා නැගෙනහිර ප්‍රජාතන්ත්‍රවාදය හා සාමය යළි ස්ථාපිත කිරීමේ ජයග්‍රහණය උදෙසා අප ඇප කැප වී සිටිමු. සාමය උදාකරලීමේ රජයේ ප්‍රයත්නයට මේ රටේ ජනතාව දිගින් දිගටම සහාය දක්වන බව අපට ඒකාන්ත වශයෙන්ම විශ්වාසයයි. සියළුම ජනකොටස්වලට එකමුතුව, සමානාත්මතාවයෙන් හා සහෝදරත්වයෙන් යුතුව අප මව්බිමේ ජීවත් වීමට ඉඩ තිබිය යුතුය යන්න අපේ විශ්වාසයයි. එල්ටීටීඊ සංවිධානය විසින්, අපව බලෙන් ඇද දැමීමට තැත් කරන විනාශකාරී මාර්ගයට නොවැටී සිටීමට අප සැම දෙනාම අධිෂ්ඨාන කරගත යුතුය.

ත්‍රස්තවාදය යුද්ධමය ක්‍රියාමාර්ග මගින් මර්දනය කළ හැකි නමුත් ජනවාර්ගික ප්‍රශ්නය එසේ විසඳිය නොහැකි බව අවධාරණය කරනු කැමැත්තෙමි. සුළු ජනකොටස්වල සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රශ්නවලට දීර්ඝකාලීන විසඳුම් සෙවිය හැක්කේ සංවාදය හා දේශපාලන විසඳුම් මගිනි.

ජාත්‍යන්තර ප්‍රජාව විසින් ශ්‍රී ලංකාව පිළිබඳව දක්වන ලද ආකල්පය පසුගිය මාස 18 තුළදී මේ ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන්ම වෙනස් කරන ලදී. මෙය මානව හිමිකම් සුරැකීම සඳහා වූ අපේ ඇපකැපවීමත්, එම අරමුණ අරභයා අප විසින් ගනු ලැබූ ක්‍රියා මාර්ගවලත් ප්‍රතිඵලයකි. ජනවාර්ගික ප්‍රශ්නය සම්බන්ධයෙන් අප අනුගමනය කළ ප්‍රතිපත්තිය ජාත්‍යන්තර ප්‍රජාවේ පැසසුමට ලක්විය. ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් සෙවීමේ දී මෙන්ම, එල්ටීටීඊ සංවිධානයට එරෙහිව යුද වැදීමට අවශ්‍යවූ යුද්ධෝපකරණ සපයා ගැනීමේදීත්, අපට ලැබුණු සහයෝගයෙන් ඒ බව මනාව ඔප්පු වේ.

මෑතදී සිදුවූ අවාසනාවන්ත සිද්ධියෙන් ද අපට ලොව පුරා මිතුරන් සිටින බව ඔප්පු විය. මෙම අවාසනාවන්ත සිදුවීම ජාත්‍යන්තර ප්‍රජාවේ දැඩි අප්‍රසාදයට ලක්විය. මේ සිද්ධිය

ජාත්‍යන්තර ප්‍රජාව විසින් හෙලා දකිනු ලැබුවේ අප රජයේ සාම ප්‍රයත්නයට එල්ටීටීඊ සංවිධානය විරුද්ධවීම නිසා බව අමතක කළ යුතු නොවේ.

එල්ටීටීඊ සංවිධානයටත්, ලංකාවේ ත්‍රස්තවාදයට අනුබල දෙන වෙනත් සංවිධානවලටත් සාමූහිකව එරෙහි වන ලෙස අප ජාත්‍යන්තර ප්‍රජාවෙන් ඉල්ලා සිටිමු. එම සංවිධානවල අරමුණු උතුරු නැගෙනහිර ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ලබා ගැනීමේ රජයේ උත්සාහය අඩපන කිරීමයි. එල්ටීටීඊ සංවිධානය විසින් කාර්යාල පවත්වාගෙන යනු ලබන්නාවූත්, මත්ද්‍රව්‍ය හුවමාරුවේ යෙදෙන්නාවූත් ජනමාධ්‍ය අයුතු ලෙස ප්‍රයෝජනයට ගන්නාවූත් විදේශීය රාජ්‍යවලින් අප ඉල්ලා සිටින්නේ එම සංවිධානය සම්බන්ධයෙන් දැඩි ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසයි. අප මෙසේ ඉල්ලා සිටින්නේ මිත්‍ර ජාතියක් විසින් කරනු ලබන ඉල්ලීමක් වශයෙන්ම නොවේ. එය හුදෙක් එක්සත් ජාතීන්ගේ සංගමයේ සාමාජිකයකු වශයෙන් කෙරෙන ඉල්ලීමකි.

මෙතෙක් අපට සහයෝගය දුන් ආකාරයටම ඉදිරියේදීත් විදේශීය රාජ්‍ය විසින් එල්ටීටීඊ සංවිධානයට විරුද්ධව සාමූහික ක්‍රියාමාර්ගයක් ගනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. ජනවාර්ගික ප්‍රශ්නයේ නිමාවක් දැකීමට රජය ඇරඹූ දේශපාලන ක්‍රියාදාමයට ඉන් විශාල අනුබලයක් ලැබෙනු ඇත.

## රජයේ ආර්ථික ප්‍රතිපත්ති

මීට පෙර අවස්ථා කීපයකදීම රජයේ ආර්ථික ප්‍රතිපත්ති පැහැදිලි කරනු ලැබ ඇත. ආර්ථිකයේ මූලික අංශවල සංවර්ධනයට උපකාරී වන ප්‍රතිපත්තිද ඇතුළත් අටවැදෑරුම් වැඩ සටහනකින් සමන්විත සවිස්තරාත්මක ප්‍රකාශයක් මෙම සභාව හමුවේ කරන ලද ප්‍රථම ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් මම පැහැදිලි කළෙමි. රජයේ ප්‍රධාන ආර්ථික උපායමාර්ග 1995 හා 1996 අයවැය ලේඛන මගින් ක්‍රියාවට නංවන ලදී. බලයට පත්ව ගතවූ මුල් වසර ඇතුළත රජයේ ආර්ථි ක්‍රියාකාරීත්වයේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් "අනාගතය සඳහා සවිමත් අඩිතාලමක් ; රජයේ ආර්ථික ප්‍රගතිය 1994 – 1995" මැයෙන් දැනටමත් පාර්ලිමේන්තුව හමුවේ තබා ඇත.

අපේ ආර්ථික ප්‍රතිපත්තියෙන් කාටත් සාධාරණව, සමව භුක්ති විඳිය හැකි මෙන්ම, වේගවත් සහ පවත්වාගෙන යා හැකි සංවර්ධනයක් ඇති කිරීමට අනුබල දෙන අන්දමේ ශක්තිමත්, සාර්ව ආර්ථික හා මූල්‍ය රටාවක් ගොඩනැංවීම අරමුණු කෙරෙන බව මා කලින් සඳහන් කර ඇත.

මේ ප්‍රතිපත්තිය සාක්ෂාත් කරගැනීම සඳහා ආර්ථික ක්‍රමයෙහිත් එය ක්‍රියාත්මක කෙරෙන ආකාරයෙහිත් මූලික වෙනස්කම් රැසක් සිදුකර ඇත.

මේ සඳහා දීර්ඝ, මධ්‍යම හා කෙටිකාලීන ප්‍රමුඛතා වෙන වෙනම හඳුනාගත් මනාව ගැලපූ ආර්ථික උපාය මාර්ගයන් සකස් කරනු ලැබ ඇත.

මීට පදනම් කරනු ලැබුවේ බලයේ සිටින අතලොස්සකගේ පුද්ගලික ඕනෑ එපාකම් සපුරාලීම සඳහා විටින්විට ගන්නා ලද, අක්‍රමවත් තීරණ නොව, ජාතික ප්‍රමුඛතා මත පදනම් වූ පොදු අවශ්‍යතාවයන්ය. අප යුද්ධයකට අවතීර්ණව සිටියත්, එය අපේ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමෙහිලා කොහෙත්ම බාධාවක් නොවනු ඇත.

පෞද්ගලික අංශය ආර්ථික වර්ධනයේ මූලික බලවේගය බවට පමුණුවා ලමින්, වෙළඳපළට හිතකර ප්‍රතිපත්ති අනුගමනය කිරීම සඳහා අපගේ කැපවීම යළි අවධාරණය කරගනිමින්, සීඝ්‍ර වර්ධනයක් ළඟා කරගැනීමට අපගේ පෞද්ගලික අංශයේ කැපවීම වඩාත් ධෛර්යමත් කිරීම සඳහා අප විසින් පෙරට වඩා ඵලදායී පියවරවල් ගනු ඇත. එසේ වුවද වෙළඳපොල බලවේග නිසි ලෙස ක්‍රියාත්මක නොවන ක්ෂේත්‍රයන්හි, වෙළඳපොළේ ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීම සහ එය අනුපූරණය කිරීම වෙනුවෙන් රජයට ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකිරීමට සිදුවන බව මෙහිදී තේරුම්ගත යුතුය. රජයේ මෙම කාර්යභාරයට, ප්‍රධාන වශයෙන් ප්‍රාථමික හා ද්විතීය අධ්‍යාපනය, රෝග නිවාරණය, දිළිඳුකම පිටුදැකීම වැනි මානව සම්පත් සංවර්ධනය සඳහා වූ වියදම් ද, පරිසරය සුරැකීම සහ පෞද්ගලික අංශයෙන් අපේක්ෂා කළ නොහැකි ආකාරයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැනි ක්ෂේත්‍රයන් ඇතුළත් වේ.

සීඝ්‍ර හා දිගටම පවත්වා ගෙන ගිය හැකි ආර්ථික වර්ධනයක් සාක්ෂාත් කර ගැනීම, විරැකියාව අඩුකිරීම, දුගීබව තුරන් කිරීම සහ ජීවන වියදම අඩුකිරීම යනාදී අරමුණු පදනම් කරගත් අපගේ සංවර්ධන උපාය මාර්ගයේ හරය තුළ මතු කියවෙන අනොන්‍ය වශයෙන් දිරිගන්වන සුළු මූලිකාංග කිපයක් ගැබ්ව ඇත.

* සුපරීක්ෂාකාරී මූල්‍ය ප්‍රතිපත්ති හා රජයේ වියදම් අඩුකිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම් තුළින් සවිමත් සාර්ව ආර්ථික පදනමක් ගොඩනැංවීම.

* අපනයන හා තරඟකාරී ආනයන ආදේශක කර්මාන්ත හා සේවාවන්ගේ වර්ධනය දිරිගැන්වීමට තුඩුදෙන වාතාවරණයක් ඇති කිරීමට සමත්වන පරිදි අර්ථාන්විත තීරුබදු ක්‍රමයක් හඳුන්වාදීම හා නිදහස් වෙළඳ හා ගෙවීම් ක්‍රමයක් ඇති කිරීම.

* පුද්ගලික ආයෝජන ක්‍රමවත්ව වර්ධනය කිරීම සහ ආදායම් සාධාරණ ලෙස ව්‍යාප්තවීම දිරිගන්වන ආකාරයට සරළවූත්, විනිවිද පෙනෙන සුළුවූත්, පුළුල් පදනමකින් යුක්තවූත් බදු උපාය මාර්ග දියුණු කිරීම.

* දුප්පත් හා අඩු ආදායම් ලබන පවුල්වලට වඩාත් හොඳින් ආදායම් බෙදී යන පරිදිත් එකී පවුල්වලට දිගුකාලීන ආදායම් ඉපැයීමේ කටයුතුවල නියැලිය හැකිවන ඵලදායී සමාජ ආරක්ෂණ වැඩපිළිවෙල සඳහා වූ සුභසාධන වියදම් වැඩ සටහන් සකස්කිරීම හා ශක්තිමත් කිරීම.

* සම්පත් ඵලදායී ආයෝජන වෙත යෙදවීම වඩා පහසු කිරීම සඳහා බැංකු හා මූල්‍ය ආයතන ශක්තිමත් කිරීම සහ ප්‍රාථමික වෙළඳපළ පුළුල් කිරීම.

* ඇතැම් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් ඇතුළුව දැනට ආර්ථික කටයුතු සඳහා අවශ්‍ය ප්‍රාග්ධන, තාක්ෂණ සහ කළමණාකාරිත්ව හැකියාවන් ඉහළ මට්ටමින් ලබාගැනීම සඳහා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කිරීම.

* අධ්‍යාපනය, සෞඛ්‍ය, නිපුනතා සංවර්ධනය, කෘෂිකර්මය, වාරිමාර්ග, ග්‍රාම සංවර්ධන, පරිසරය සහ යටිතල පහසුකම් සඳහා ප්‍රාථමික ආයෝජන ඉහළ මට්ටමට නැංවීම සඳහා රාජ්‍ය ආයෝජන උපායමාර්ගවලට නව මුහුණුවරක් දීම.

## ව්‍යුහාත්මක දුර්වලකම්

පොදු පෙරමුණු රජයට උරුමවූයේ ව්‍යුහාත්මක අතින් දුර්වලවූ ආර්ථිකයකි. 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීමෙන් අනතුරුව, මුල් කාලයේදී පෙන්නුම් කරන ලද, සියයට 6–8 අතර අගයන් පෙන්නුම් කළ ඉහළ ආර්ථික වර්ධන වේගය, දිගුකල් රඳ පවත්වාගෙන යාමට නොහැකි විය. වර්ධන වේගය ක්‍රමානුකූලව පහත වැටුණු අතර, 1987 දී එය සියයට 1.5ක් පමණ විය. ඉන්පසු වසර කීපයක් හැරුණු විට, ආර්ථික වේගය සියයට 5 කටත් අඩු අගයක විය. අපගේ ආර්ථිකයේ කොඳුනාරටිය වන කෘෂිකාර්මික අංශය, 1977න් පසු කාලය තුළදීම සියයට 2.7ක අඩු වර්ධනයක් සහිතව පසුගාමී බවක් පෙන්වීය. සාර්ථකත්වයක් පෙන්නුම් කරන ලද අංශ අතර, කාර්මික අපනයනයන්හි ඉහළ නැගීමක් පෙන්නුම් කළ අතර, ආර්ථිකයේ සමහර අංශවල පමණක් පෞද්ගලික ආයෝජනයන් තරමක ඉහළ යාමක් පෙන්වීය. කෙසේ වුවද, කාර්මික නිෂ්පාදන කටයුතු ඇතැම් භූගෝලීය ප්‍රදේශයන් කිහිපයක් තුළ ඒකරාශීවීමත් පහසුවෙන් ප්‍රවේශ විය හැකි ඇතැම් විදේශීය වෙළඳපොළ වෙනුවෙන් නිෂ්පාදනය කිරීම නිසා ආර්ථිකයේ ඇතැම් අංශවලට පමණක් දියුණුව සීමාවීමත් නිසා ආර්ථිකයේ ව්‍යුහාත්මක අසමතුලිතතාවයන් මතුවන්නට විය. 1986 දී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 15 ක් වූ රාජ්‍ය ආයෝජනයන් 1994 දී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 7ක් දක්වා දිගින් දිගටම පහත වැටුණි. 1970 කාලයේ දී අධ්‍යාපන සහ සෞඛ්‍ය අංශයන් සඳහා කෙරුණු දළ දේශීය නිෂ්පාදිතයෙන් පිළිවෙලින් සියයට 4 සහ 2 වූ වියදම්, 1994 දී පිළිවෙලින් සියයට 3 සහ 1.4 දක්වා පහත වැටුණි. වතු වැවිලි, ගමනාගමන, විදුලිබල හා බලශක්ති, විදුලි සංදේශ සහ වරාය වැනි වැදගත් අංශයන්හි ආයෝජනයන් වසර කීපයක්ම නොසලකා හැර තිබුණි. පසුගිය

වසර පහේදී මෙම අංශයන්හි රාජ්‍ය ආයෝජනයන් නොවුනුතර
විය. ආර්ථික පරිපාලනයෙහි මූලික දුර්වලතාවයන් පෙන්නු
කරමින්, උද්ධමනය සමහර වර්ෂවලදී සියයට 20 කටත් වඩා ඉහ
නැග තිබුණු අතර සියයට 13 ක සාමාන්‍ය අගයන් පෙන්නු
කරමින් උද්ධමන වේගය සියයට 10 ඉක්මවා තිබිණ.

මෙම තත්වය වඩාත් බැරෑරුම් කෙරෙමින් අයවැය හිඟයන්ද ද
දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13 ක් පමණ ඉහළ අගයක වි
1985 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1 ක් පමණ වූ ආරක්ෂ
වියදම්, රජයේ වියදම්වලින් සියයට 15 ක් පමණ වූ අතර, ද
දේශීය නිෂ්පාදනයෙන් සියයට 5 ක් පමණ දක්වා ඉහළ නැග ඇ
නොකඩවා පැවති ඉහළ අයවැය හිඟයන්, ණය ගැනීම් මගි
පියවා ගැනීමට සිදුවූ අතර, ඒ නිසා රාජ්‍ය ණය ප්‍රමාණය රටේ
දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95 ක් පමණ දක්වා ඉහළ නැ
තිබුණි. පුනරාවර්තන වියදමින් සියයට 30 ක් පමණ, රාජ්‍ය ණ
වෙනුවෙන් පොලී ගෙවීම් සඳහා වැයවන අතර, එය ආරක්ෂ
වියදම්ද සමග එක්වගත් කළ රජයේ ආදයමින් අඩක් පම
ප්‍රමාණයක් විය. මේ නිසා අත්‍යාවශ්‍ය වන්නා වූ සංවර්ධන කටයුතු
වලට රජයේ ආයෝජන යෙදීම වලකාලනු ඇත.

**ජයග්‍රහණ**

මෙවන් පසුබිමක් තුළ, නිෂ්පාදනය පහත වැටීම, උද්ධමනය ඉහළයාම හා දිනෙන් දින උග්‍රවන දිළිඳුබව සහ විරැකියාව නිසා ආර්ථිකය පරිහානියට පත්වීම වළකා, එය විධිමත්ව හැසිරවීමත්, ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා කාර්ය සම්පාදනය කිරීම අප විසින් කළයුතු ඉතාම හදිසි කර්තව්‍ය විණි. ක්ෂණික ලෙස විසඳිය යුතුව තිබූ අයවැය හිඟය සම්බන්ධ ගැටළු ලිහිල් කරගැනීම සඳහා මැදිකාලීන මූල්‍ය ස්ථාවර කිරීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන ලදී. ආරක්ෂක කටයුතු සහ අවතැන්වූවන් සඳහා දැරීමට සිදුවූ ඉතා විශාල වියදම් මෙන්ම රාජ්‍ය ණය සඳහා අධික පොලී ගෙවීම් දැරීමට රජයට අනිවාර්යයෙන්ම සිදුවුවත් 1994 වසරේදී

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට දහයක්ව (10%) පැවති අයවැය පරතරය 1995 දී සියයට නවය (9%) දක්වා අඩුකරගැනීමට සාර්ථක ලෙස හැකිවිය. රාජ්‍ය ආරක්ෂක කටයුතු සඳහා දරන්නට සිදුවූ වියදම් ඉතා අධික නොවූයේ නම් මෙම අයවැය පරතරය 1995 වසරේදී දළ ජාතික නිෂ්පාදිත යෙන් 8% කට අඩු මට්ටමක තබාගැනීමට හැකිව තිබුණි.

ආරක්ෂක කටයුතු, ඉතා හදිසියෙන් කළයුතුව ඇති ප්‍රතිසංස්කරණ කටයුතු සහ පුනරුත්ථාපන කටයුතු සඳහා දැරීමට සිදුවන අධික වියදම් නිසා මෙම මූල්‍ය පරතරය තවදුරටත් අවම කිරීම දුෂ්කර විය හැක. එහෙත් එම අරමුණ ඉටුකරගැනීමට රාජ්‍ය ආදයම් සහ වියදම් ව්‍යුහයේ පවත්නා ඇතැම් දුර්වලතා මගහැරීම සඳහා ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වන වැඩ සටහන් මගින් ප්‍රමුඛතාවය දෙනු ඇත.

අප රජය අනුගමනය කළ ක්‍රියාදාමයන් නිසා උද්ධමන වේගය සාර්ථකව අඩු කිරීමට අපට හැකිවිය. සියයට දහතුනක (13%) පමණ පැවති සාමාන්‍ය වාර්ෂික උද්ධමනය 1995 වසරේ දී සියයට අටක (8%) පමණ මට්ටමකට පහත දමන ලදී. 1994 අගෝස්තු මාසයේ සිට යුදමය කටයුතු අනිවාර්ය තරකිරීම් සිදුවූ 1995 ජුනි මාසය දක්වා කාලය තුළ උද්ධමනය ක්‍රමානුකූලව පහත වැටෙමින් තිබුණි. ජාත්‍යන්තර වශයෙන් භාණ්ඩ මිල වැඩිවීම, නිෂ්පාදන වියදම් වැඩිවීම සහ වෙළඳපළ අපූර්ණතා නිසා පසුගිය මාස කිහිපය තුළ ඇතැම් භාණ්ඩවල මිල වැඩිවීමක් දක්නට ලැබුණි. එමනිසා අප ලබාගත් සාර්ථක ප්‍රතිඵල නොකඩවා පවත්වාගෙන යාම සඳහා ක්ෂේත්‍රයන් කිහිපයක දීම අපගේ උත්සාහයන් කිපගුණයක් වැඩිකළ යුතුව ඇත.

යුද්ධමය වාතාවරණයක් යටතේ වුවද සාධාරණ මිලට වෙළඳපළට භාණ්ඩ සැපයුම, බාධාවකින් තොරව පවත්වාගෙන යාම අප විසින් සහතික කරනු ලැබ ඇත. උතුරු හා නැගෙනහිර පළාත්වලට පවා අත්‍යවශය පාරිභෝගික භාණ්ඩ සැපයීම බාධාවකින් තොරව සිදුවේ. සතොස මගින් දීපව්‍යාප්තව ක්‍රියාත්මක

කළ "වරලත් නියෝජිත ආයතන" මගින් සමුපකාර සමිති සහ පුද්ගලික අංශයට සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ සිල්ලර වෙළඳ නියෝජිතයන් ලෙස කටයුතු කිරීමේ අයිතිය ලබාදීම නිසා, පුළුල් සිල්ලර වෙළඳසැල් ජාලාවක් මගින් සතොස භාණ්ඩ සුලභ කෙරුණි. එම ආයතන ඒකාධිකාරී වෙළඳාම වෙළඳපළ අපූර්ණතාවන් අවම කිරීමට හේතු වී ඇත. තවද නිදහස් ආයතන බලපත් ක්‍රමයක් මගින් අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයන වෙළඳාමේ ඒකාධිකාරය බිඳ හෙලීය. මෙය ඇතැම් වෙළඳුන් අතර ජනප්‍රිය නොවුවද පාරිභෝගිකයින්ගේ සුභසාධනය වැඩි දියුණු කිරීම සඳහා වෙළඳපල තරඟකාරීත්වය තියුණු කිරීම අවශ්‍යයෙන් ම කළයුත්තක් බව මෙහිදී සඳහන් කළ යුතුය. බාධාවකින් තොරව භාණ්ඩ සැපයීම සහතික කරවීම සඳහාත්, මිළ ගණන් ස්ථාවර මට්ටමකට පවත්වාගෙන යාම සඳහාත් බන්ධිත ගුදම්කරු ක්‍රමය මගින් ප්‍රමාණවත් ආහාර ද්‍රව්‍ය තොග ගබඩා කර තබාගැනීමට කටයුතු කරනු ලැබේ.

දේශීය සහ විදේශීය යන දෙඅංශයෙන් ම නොයෙකුත් අහිතකර තත්ත්වයන් පැවතුන ද 1995 වසරේ දී සියයට 5.5 ක ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට අපි සමත්වීමු. කාර්මික අපනයනයන් සියයට 15ක වර්ධනයක් සහ සමස්ත නිමැයුම් අංශයේ සියයට 9 ක වර්ධනයක් වාර්තා විය. ආරක්ෂක කටයුතුවලට සම්බන්ධව ආනයනයන්හි අතිවිශාල වැඩිවීමක් යටතේ වුවද, අපගේ විදේශ වර්තන ගිණුමේ හිඟය දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 6.5 දක්වා අඩු කර ගැනීමටත්, විදේශ වත්කම් ඇමරිකානු ඩොලර් බිලියන 2.1 ක පමණ මට්ටමේ පවත්වා ගැනීමටත් අපි සමත් වීමු.

## උපකාරක ප්‍රතිපත්ති සමුදායක්

මීට පෙර ඉදිරිපත් කරන ලද මාගේ ප්‍රතිපත්ති ප්‍රකාශන දෙක මගින් මෙන්ම රජයේ අයවැය ලේඛන දෙක මගින් ද පවත්නා බදු හා තීරු බදු ව්‍යුහයේ සිදු කිරීමට යන වැදගත් වෙනස්කම් පිළිබඳ ඉඟියක් දෙන ලදී. එසේ කරන ලද්දේ පෞද්ගලික අංශය මුල්

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

කරගත් සංවර්ධන ක්‍රියාවලිය පහසු කරලීමේ අටියෙනි. පාරිභෝගිකයන් හා ආයෝජකයන් යන දෙකොටසට වඩාත් වාසිදායී තත්ත්වයන් ඇතිවන පරිදිත් ඔවුන් අතර තරඟකාරී බව ඉස්මතු වන පරිදිත් තීරුබදු සංයුතිය අර්ථාන්විත කරමින් තීරුබදු අනුපාතිකයන් අඩුකරන ලදී. 1996 අයවැය මගින් පෞද්ගලික හා ආයතනික බදුවලට අදාළ සවිස්තරාත්මක යෝජනා මාලාවක් හඳුන්වා දෙන ලදී. එමගින්,

* ආදායම් බද්ද සියයට 35 දක්වා අඩුකරන ලද අතර බද්දෙන් නිදහස් කෙරෙන ආදායම් සීමාව ඉහළ දමන ලදී.
* රේගු බදු සියයට 35ක උපරිමයකට යටත්ව සම්මත අනුප්‍රමාණ 3කට සීමා කරන ලදී.
* හිතුමතේ පිරිනැමූ තීරුබදු සහන හා එසේ පනවනු ලැබූ අධිභාර ඉවත් කරන ලදී. තවදුරටත් ආදායම් බදු හා තීරුබදු ක්‍රමවත් ලෙස අඩු කිරීම ඉදිරියේ දී සිදු කරනු ඇත.

බදු පරිපාලනය වැඩි දියුණු කිරීමත්, ආයෝජනය සඳහා නැඹුරු වූ බදු ක්‍රමයක් සකස් කිරීමේ අරමුණින් දැනට පවත්නා පිරිවැටුප් බදු ක්‍රමය වෙනුවට භාණ්ඩ සහ සේවා සඳහා වූ බදු ක්‍රමයක් මෙම වර්ෂය මැද භාගයේ දී හඳුන්වා දීම සඳහා අවශ්‍ය සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම බදු ක්‍රමය ක්‍රියාත්මක කිරීමත් සමග නිෂ්පාදන බදු සහ ආනයන තීරු බදු තව දුරටත් සරළ කෙරෙනු ඇත. දේශීය කර්මාන්ත වැඩි දියුණු කිරීම සඳහා නිෂ්පාදන බදු සරල කර ඇත.

තරඟකාරී වාතාවරණයට මුහුණ දිය හැකි පරිදි මූල්‍ය අංශය ශක්තිමත් කිරීම සඳහා පවත්නා නීති රීතිවලට නව සංශෝධන ඉදිරිපත් කර ඇත. තරඟකාරී වාතාවරණයකට ලඟා වෙමින් පවතින බැංකු ක්‍රමය තුළ කාර්යක්ෂම ලෙස තරඟ කිරීමට හැකිවීම සඳහා සහ මූල්‍යමය හැකියාව වැඩි දියුණු කිරීමේ අරමුණු ඇතිව රාජ්‍ය බැංකු හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රාග්ධන මට්ටම වඩාත් ශක්තිමත් කිරීම මේ අවුරුද්ද තුළ සිදු කිරීමට බලාපොරොත්තු වේ.

රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය හා ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කොමිසමක් පත්කරන ලදී. පසුගිය කාලයේ පැවැති භාවිතයන්ට සහමුලින්ම වෙනස් විනිවිද පෙනෙන කාර්යක්ෂම වූ ක්‍රියාවලියක් තුළ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කරනු ලැබේ. දැනටමත් කොළඹ ගෑස් සමාගම වැනි වාණිජමය ව්‍යවසායයන් කිහිපයක් විදේශීය ශිල්ප ඥාණය හා කළමනාකාරිත්වය ලබා ගනිමින් පුද්ගලීකරණය කර ඇත. මෙමගින් රුපියල් බිලියන 4.8ක් මේ දක්වා ලබාගෙන ඇති අතර, එයින් රුපියල් බිලියන 3.0ක් ම විදේශීය ආයෝජකයින් ගෙන් ලබාගත හැකි විය. එයට අමතරව ඇමරිකානු ඩොලර් දශලක්ෂ 40ක් (රුපියල් දශ ලක්ෂ 2,100) පුද්ගලීකරණය කරන ලද කොළඹ ගෑස් සමාගමෙ ආයෝජනය කර ඇත. එයාර් ලංකා, ශ්‍රී ලංකා ටෙලිකොම් සහ ලංකා විදුලි සමාගම වැනි ප්‍රමුඛ ව්‍යවසායන් කිහිපයක් ප්‍රතිව්‍යුහගතකරණයට ලක් කර ඇත. රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම පසුගිය රජය කාලයේ අයථා ක්‍රම සහ දූෂණයන්ගෙන් යුතුව පුද්ගලීකරණයට ලක්කළ වැවිලි සමාගම් ඇතුලු ඇතැම් ව්‍යවසායන් ද ඒවායේ වැඩි දියුණුව සඳහා ප්‍රතිව්‍යුහගත කරන ලදී.

## කාර්මික සංවර්ධනය

අපේ ආර්ථිකයේ කර්මාන්ත අංශයේ ප්‍රධාන දුර්වලතාවක් නම් රෙදිපිළි වැනි සීමිත ප්‍රමාණයක් මත අනවශ්‍ය ලෙස අධික බලාපොරොත්තු තබා ගෙන සිටීමය. 1996 අයවැය මගින් එකතු වූ වටිනාකම් වැඩි උසස් තාක්ෂණික මට්ටමේ කර්මාන්ත විවිධාංගීකරණ මාර්ගයකට ආර්ථික මෙහෙයවීම සඳහා උත්සාහ ගන්නා ලදී. එම අයවැය මගින් ආයෝජන මණ්ඩලයට ප්‍රදානය කරන ලද දිරිගැන්වීම් මාලාව අපනයනයට නැඹුරු සමාගම්වලට හා විශාල සංවර්ධන යෝජනා ක්‍රමවල නියැලී සිටින ආයෝජකයන්ට ද අලුත් සහන වශයෙන් ව්‍යාප්ත කරන ලදී.

පෞද්ගලික අංශය විසින් මෙම අවස්ථාවන් ප්‍රයෝජනයට ගෙන පුනර්ජීවනය ලබා ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට වඩ වඩාත් දායක වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

පහත සඳහන් අංශ ප්‍රමුඛතාවය ලැබිය යුතු අංශ ලෙස අප හඳුනා ගෙන ඇත.

කෘෂි කර්මාන්තය, වැවිලි කර්මාන්තය විවිධාංගීකරණය, සම හා රබර් ආශ්‍රිත කර්මාන්ත, පිඟන් හා ලෝහ නොවන ඛණිජ කර්මාන්ත, නිපුනතා පදනම කරගත් තොරතුරු තාක්ෂණය, සූක්ෂමතා කර්මාන්ත, සංචාරක අංශය, ලුහු ඉංජිනේරු හා විදුලි කර්මාන්තය.

නිදහස් වෙළඳ කලාප 4ට අමතරව රට පුරා කර්මාන්ත පුර කිපයක් ඇති කිරීමේ කටයුතු දැනට කරගෙන යනු ලැබේ. මේවායින් දේශීය, මධ්‍යම හා කුඩා පරිමාණ කර්මාන්ත හා ග්‍රාමීය කර්මාන්ත සංවර්ධනයට තුඩුදෙන වාතාවරණයක් සළස්වනු ඇත.

## කාර්මික සම්බන්ධතා

රටේ අවශ්‍යතාවයන්ට ගැලපෙන කාර්මික සම්බන්ධතා ක්‍රමයක් පිහිටුවීම රටේ ආයෝජන තත්වය වර්ධනය කිරීමේ වැදගත් අංගයකි. මේ සම්බන්ධයෙන් වෙළෙඳ පොලට හිතකර පරිසරයක් තුළ රජය සමග සේව්‍ය හා සේවක කොටස් පලදායී ලෙස සම්බන්ධ කිරීම සඳහා සුදුසු ආයතන යන්ත්‍රයක් පිහිටුවීම අවශ්‍ය වේ. ජනවාරි 24 වෙනි දින විධිමත් ලෙස ආරම්භ කරන ලද ජාතික සංවර්ධන සභාවට ආර්ථිකයේ ඉහලම වර්ධනයක් ලබා ගැනීම සඳහා උදව්වීමේ අරමුණින් ජාතික ආර්ථික ප්‍රතිපත්ති සැකසීමේ කාර්ය පැවරී ඇත. මෙහිදී උනන්දුවක් දක්වන අදාළ කණ්ඩායම්වල අදහස් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. මේ සම්බන්ධයෙන් ජාතික සංවර්ධන සභාව විසින් රජය හා ස්වාමි පක්ෂය සම්බන්ධ කර කම්කරුවන් ද නියෝජනය වන අකාරයට එහි සංවිධාන කටයුතු කරන ලදී. ජාතික සංවර්ධන සභාවට සමගාමීව එම සභාවේ වැඩ කටයුතුවලට අදාළව රැකියා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීම සඳහා මවිසින් ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවන ලදී.

එක් අතකින් ඵලදායීතාවය නංවාලීමත්, අනෙක් අතට සිය සේවා කොන්දේසි පිළිබඳ සාකච්ඡා මගින් සම්මුතියකට එළඹීමට සේවාදායකත්වයට ඇති මූලික අයිතීන් රැකගැනීමත් යන කරුණු එලගැන්වීම සඳහා කාර්මික සබඳතාවල නව හැඩගැන්වීමක්

අත්‍යවශ්‍ය වේ. සේවයේ යෙදී සිටින ශ්‍රම බලකායේ මූලික අයිතීන් සුරැකීමේ වගකීම පමණක් නොව, විරැකියාවෙන් සිටින සියලු දෙනාට ද අප සමාජයේ හිමිවිය යුතු නියම තැන සුරක්ෂිත කිරීම සඳහා රැකියා ඉඩප්‍රස්ථා ඇති කිරීමේ වගකීම ද, අප විසින් උසුලනු ලබන බව මෙහි දී අවධාරණය කළ යුතුය.

අපගේ රැකියා ප්‍රතිපත්ති සහ උපාය මාර්ගවල අවධානය ශ්‍රම වෙළඳපොලේ පවත්නා, වලක්වාගත හැකි දැඩි ස්වභාවය සහ ඒ වටා ඇති දැඩිප්‍රතිපත්ති ලිහිල් කිරීම කෙරෙහි යොමු වී ඇත. වෘත්තීය සමිතිවල වගකීම් සමගම වෘත්තීය සමිති පිළිගැනීමේ ප්‍රතිඵලය වශයෙන් දේශීය හා විදේශීය සියළු සේවායෝජකයන් හා සේව්‍යයන් අතර ඒකසමාන අන්‍යොන්‍ය අවබෝධයක් සහ විශ්ව සාධාරණ පිළිගැනීමක් ඇතිවනු ඇතැයි මම විශ්වාස කරමි.

## යටිතල පහසුකම් සංවර්ධනය

මගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දී, මූලික යටිතල පහසුකම් වන විදුලිය, විදුලි සංදේශ හා මහාමාර්ග ආදිය සඳහා ඇති ඉල්ලුම සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රාජ්‍ය අංශය සතු සම්පත් අතර ඇති නොගැලපීම හේතුවෙන් පෞද්ගලික අංශයේ මැදිහත්වීමේ අවශ්‍යතාවය ගැන සඳහන් කළෙමි. මෙය රාජ්‍ය අංශයට නුපුරුදු පරිපාලන කාර්යයක් නිසා, අප හිතුවාට වඩා වර්ධනය සෙමින් සිදුවේ. එසේ වුවත් දැනටමත් යටිතල පහසුකම් යෝජනාක්‍රම දෙකක් සඳහා පෞද්ගලික අංශ සමග ගිවිසුම් අත්සන් කර ඇත. ගොඩනගා අයිතිය පවත්වාගෙන ක්‍රියාත්මක කිරීමේ (BOO) හා ගොඩනගා ක්‍රියාත්මක කර අයිතිය පැවරීමේ (BOT) වැඩ පිළිවෙළ යටතේ විදුලිබල යෝජනා ක්‍රම දෙකක් සහ කොළඹ වරාය සංවර්ධන යෝජනා ක්‍රමය ලඟදීම ඇරඹීමට නියමිතය. විදුලිබලය සැපයීම පුළුල් කිරීම සඳහා විදුලි උත්පාදක යන්ත්‍ර කෙටි දැනුම් දීමක් මගින් වුව ද, ආනයනය කිරීමේ හැකියාව පෞද්ගලික අංශයට ලබාදෙනු ඇත.

විදුලි සංදේශ සංවර්ධනය යටතේ ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ අංශයට ගැලපෙන හවුල්කරුවකු සමඟ උපායශිලි සංධානයක් ගොඩ නැගීමට කටයුතු කරගෙන යන අතර, මේ වර්ෂය තුළදී

පෞද්ගලික අංශය විසින් රූහැන් මාර්ග රහිත ප්‍රාදේශීය දුරකථන මාර්ග ලක්ෂ දෙකක් ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. කොළඹ වරාය ප්‍රධාන ප්‍රාදේශීය කේන්ද්‍රීය වරායක් වශයෙන් පරිවර්තනය කිරීමේ අරමුණු ඇතිව එය ගොඩනගා අයිතිය පවත්වාගෙන ක්‍රියාත්මක කිරීමේ (BOO) පදනම යටතේ විශාල විදේශීය ආයෝජන මේ රටට ගෙන්වීමේ හැකියාව ඇති හවුල්කරුවකු මගින් කාර්යක්ෂමතා වර්ධනය කිරීමට හා පහසුකම් පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

මේ දක්වා අප ලබා ඇති අත්දැකීම් උපයෝගී කරගෙන රජය විසින් මේ වර්ෂය තුළ පෞද්ගලික අංශයේ යටිතල පහසුකම් ව්‍යාපෘති ඉක්මනින් තෝරා ගැනීම හා අනුමත කිරීම සඳහා ආයතන ව්‍යුහයක් හා ක්‍රියාපටිපාටියක් ඇති කිරීමට අදහස් කරනු ලැබේ. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ ආයෝජන ලේකම් කාර්යාලයේ (SIDI) කටයුතු ආයෝජන මණ්ඩලය වෙත පවරා ගැනීමත් පෞද්ගලික අංශයේ යටිතල පහසුකම් සංවර්ධන පහසුකම් සමාගම (PSIDC) පිහිටුවීමත් මේ ක්‍රියාමාර්ගවල මූලික අංග වෙයි. මේ යටතේ ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හා විදේශ සහන ණය සඳහා වූ ජර්මානු ආයතනයේ ද ආධාර ඇතිව රජය විසින් ඇමරිකානු ඩොලර් බිලියන 120ක් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා ලබාගැනීමට මං පාදා දී ඇත.

## මිලදී ගැනීමේ ක්‍රියාපටිපාටිය

රජයේ ටෙන්ඩර් මෙන්ම ගොඩනගා අයිතිය පවත්වාගෙන ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙල හා (BOO) ගොඩනගා ක්‍රියාත්මක කර පැවරීම (BOT) යෝජනා සම්බන්ධයෙන් ද රජයේ ඉල්ලීමකින් තොරව ඉදිරිපත් කෙරෙන යෝජනා සම්බන්ධයෙන් ද වූ ටෙන්ඩර් හා මිල දී ගැනීම් පටිපාටිය සඳහා වූ නව මගපෙන්වීම් මාලාවක් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. මෙමගින් රාජ්‍ය අංශයේ යෝජනා ක්‍රියාත්මක කිරීම වේගවත් කරන අතර දැනට පවතින විශාල පමාව වළක්වයි.

## වාරිමාර්ග

ප්‍රාදේශීය සභා මගින් ඉදි කරනු ලැබූ සහ ප්‍රතිසංස්කරණය කරනු ලැබූ විවිධ සුළු වාරිමාර්ග යෝජනා ක්‍රමවලට අමතරව රජය මගින් රුපියල් දශලක්ෂ 267ක වියදමින් මධ්‍ය පරිමාණ වාරිමාර්ග යෝජනා ක්‍රම 153ක් සම්පූර්ණ කරන ලදී. 1996 දී එවැනි ව්‍යාපෘති 254ක් රුපියල් දශලක්ෂ 300ක වියදමින් ඉදි කිරීමට සහ ප්‍රතිසංස්කරණය කිරීමට සැළසුම්කර ඇත.

රුපියල් දශලක්ෂ 53ක වියදමින් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම 12ක් ප්‍රතිසංස්කරණය කර ඇත.

රුපියල් දශ ලක්ෂ 750ක වියදමින් මිනිපේ/නාගදීප සහ වයඹ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතීන් දැනටමත් අරඹා ඇත.

## විදුලිය හා බල ශක්තිය.

විදුලි බලය හා බලශක්ති අංශයේ ආයෝජන අතපසු කිරීම හා ඊසාන දිග මෝසම් වර්ෂා නියමිත ලෙස නොලැබීම නිසා, ඇති වෙමින් පවතින බලශක්ති හිඟය වළක්වා ගැනීම සඳහා රජය විශේෂ පියවර ගනු ලැබේ. කැබිනට් මණ්ඩලයට වහාම වාර්තා කරනු වස්, මේ සඳහා උසස් මට්ටමේ විශේෂ කාර්ය බලකායක් පිහිටුවා ඇත. මෙම විදුලි හිඟයට මුහුණදීම සඳහා විදුලිය සංරක්ෂණය ක්‍රම සමග පෞද්ගලික අංශයට ඔවුන්ගේ බලශක්ති උත්පාදනය කර ගැනීම සඳහා වහාම පරාසයක සහන සළසනු ඇත. පසුගිය වර්ෂය තුළ දී ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වූ බලශක්ති ව්‍යාපෘති කීපයක් ක්‍රියාත්මක කිරීම ඉක්මන් කරවීමට කාර්ය සාධක බලකාය ක්‍රියා කරනු ඇත.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

පහත සඳහන් ව්‍යාපෘතීන්හි වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා කටයුතු කරගෙන යනු ලැබේ.

* මෙගවොට් 260ක විදුලිය ජනනය කරනු ලබන ජල විදුලි බල ව්‍යාපෘති 3ක්.
* මෙගවොට් 130ක් විදුලිය ජනනය කරනු ලබන තාප බලාගාර 3 ක්.
* මෙගවොට් 40ක බලය ජනනය කරනු ලබන කුඩා ජල විදුලි ව්‍යාපෘති 10ක්.
* මෙගවොට් 12ක බලය උත්පාදනය කරන සුළං බල ව්‍යාපෘතියක් සහ
* අතිරේක මෙගවොට් 80ක බලයක් ලබාදෙන ලෙස පවතින විදුලි බලාගාර නවීකරණය කිරීම.

1995 වර්ෂයේ දී ජල විදුලි යෝජනා ක්‍රමය යටතේ ඇමරිකානු ඩොලර් 80 ලක්ෂයක වියදමින් නව විදුලි සැපයුම් 1,60,000ක් ලබාදෙන ලදී.

මෙම වර්ෂයේ දී නව සැපයුම් 2,00,000ක් ලබාදීමට සැළසුම් කර ඇත.

ඇමරිකනානු ඩොලර් දශලක්ෂ 50ක වියදමින් අනුරාධපුරය, අම්පාර හා කොළඹ උප පොලවල් පිහිටුවන ලදී.

## මහාමාර්ග

1995 වර්ෂයේ දී රුපියල් මිලියන 3,700ක වියදමින් කිලෝමීටර් ලක්ෂයක පාරවල් ඉදි කරන ලද අතර, මෙයින් කිලෝමීටර් 11,000ක් ප්‍රධාන පාරවල් ද, කිලෝමීටර් 89,000ක් කුඩා පාරවල් ද වේ.

මීට අමතරව පළාත් සභා සහ ප්‍රාදේශීය සභාවලට අයත් කුඩා පාරවල් 250ක් සම්පූර්ණ කර ඇත.

මෙම වර්ෂය තුළ දී ඉදිකිරීම සඳහා ප්‍රධාන මහා මාර්ග කීපයක සැළසුම් කර ඇත.

රුපියල් දශලක්ෂ 15,000ක වියදමින් ඉදිකරනු ලබන කොළඹ සිට මාතර දක්වා වූ දකුණු මහා මාර්ගයේ වැඩ කටයුතු ආරම්භ කරන ලද අතර, ගාල්ල-හම්බන්තොට මහාමාර්ගය ඉදිකිරීමද ආරම්භ කර ඇත.

කොළඹ-කටුනායක සහ නුවර-මාතලේ යන මහාමාර්ග ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමට සැළසුම් කර තිබේ.

## පොදු ප්‍රවාහනය

පොදු ප්‍රවාහනයේ අසතුටුදායක තත්ත්වය සහ එම සේවා කාර්යක්ෂමතාව පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරෙමින් ජනතාකරණය කරන ලද බස් සමාගම් හා පෞද්ගලික බස් රථ ධාවන සංවිධානයක් වඩා කාර්යක්ෂම සංවිධාන රටාවක් තුළ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ක්‍රියා මාර්ගයක් අරඹනු ලැබ ඇත. යෝජිත ප්‍රතිසංස්කරණය යටතේ ජනතාකරණය කරන ලද බස් සමාගම් සංඛ්‍යාව 93 සිට 11 දක්වා අඩු කරනු ලබන අතර, සියළුම බස් රථ ධාවන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා මධ්‍යම සංවිධානයක් පිහිටුවනු ඇත.

මේ අතරතුර 2,000කට අධික බස් රථ සංඛ්‍යාවක් දැනට ඇති බස් රථ සංඛ්‍යාවට එකතු කරනු ලැබ ඇත. අළුත්වැඩියාවන්ගේ අත්‍යවශ්‍යතාවය හේතු කොටගෙන ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවත්නා බස් රථ විශාල සංඛ්‍යාවක් සඳහා පුළුල් පුනරුත්ථාපන වැඩපිළිවෙලක් දියත් කිරීම සැලසුම් කරනු ලැබ ඇත. ලාභදායීව පවත්වාගෙන යාමට නොහැකි සහ වඩා හොඳ පාසල් බස් රථ සේවාවක් පවත්වාගෙන යාම සඳහා රජයේ සහනාධාර වැඩපිළිවෙල ඉදිරියටත් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

## පරිසරය

පරිසර හානියේ ප්‍රධාන සාධකය වී ඇත්තේ දිළිඳු භාවයයි. තිරසාර මානව සංවර්ධනය සඳහා ඇති අවශ්‍යතාවය දිළිඳු භාවය අඩු කිරීම සඳහා ඇති කැපවීම අවධාරණය කරයි. සීඝ්‍ර ආර්ථික

සංවර්ධනයක් මේ සඳහා අවශ්‍ය වේ. තියුණු ආර්ථික වර්ධනයකින් සිදුවන පරිසර හානිය වලක්වා ගැනීම සඳහා රජය පරිසර සංරක්‍ෂණය සඳහා වූ සමබර උපාය ක්‍රමයක් තෝරාගෙන ඇත.

කර්මාන්ත අංශයට සම්බන්ධ ආයතන සැළකීමේ දී පරික්‍ෂණාත්මක කටයුතු කෙරෙහි අවධානය යොමු කරමින්, සංවිධානාත්මකව සහ වේගවත්ව කටයුතු කිරීම සහතික කිරීම සඳහා පාරිසරික කටයුතුවලට අදාළ නීති ආයතන සහ වැඩ පිළිවෙලවල් ප්‍රතිශෝධනය කරනු ඇත.

## කෘෂිකර්මය

රජයේ කෘෂිකර්මය යෝජිත උපාය මාර්ගය අරමුණු කරගනු ලබන්නේ එම අංශයේ ලාභදායකත්වය පහත හෙලමින් ආයෝජකයන් අධෛර්යමත් කරවන සුළු ප්‍රතිපත්තිමය බාධක ඉවත් කිරීම කෙරෙහිය. සංවර්ධිත රටවල් විසින් කෘෂිකර්මය සඳහා සහනාධාර ඉවත් කිරීමත් සමග අනාගතයේ ලෝක කෘෂිකාර්මික නිෂ්පාදිත මිල මට්ටම් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ වාතාවරණය යටතේ ශ්‍රී ලංකාවට ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි තුලනාත්මක වාසි නැවත ලබාගැනීමටත්, එමගින් අපේ ගොවීනට සිය නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සඳහා පොහොර සහනාධාර යෝජනා ක්‍රමයක්, සහනදායී ණය ක්‍රමයක් සහ කෘෂි ආම්පන්න සඳහා සහනදායි ආනයන බදු ක්‍රමයක් හඳුන්වාදී ඇත. මෙම අංශය ලාභදායීත්වය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අපගේ අනාගත අයවැය ලේඛන තුළින් තවදුරටත් පුළුල් වැඩ පිළිවෙලවල් යොදනු ඇත.

දැනට පිරිහී ඇති කෘෂි ව්‍යාප්ත සේවාවන් ප්‍රතිසංස්කරණය කෙරෙන අතර, මෙම කටයුතු "ගොවි සෙවන මධ්‍යස්ථාන" මගින් තවදුරටත් ශක්තිමත් කෙරෙමින්, ක්‍රියාත්මක කෙරෙනු ඇත.

සුළු හා මධ්‍ය පරිමාණයේ අංශ සඳහා පිහිටුවීමට අපේක්ෂිත යෝජිත නව සංවර්ධන බැංකුව කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත. කෘෂි පර්යේෂණ සඳහා ආයෝජන

කෙසේ වුව ද කෘෂි පරීක්ෂණ, කෘෂි බීජ සහ කෘෂි ද්‍රව්‍ය, ග්‍රාමීය යටිතල පහසුකම්, ගබඩා හා අලෙවි කටයුතු සඳහා වන ආයෝජන ප්‍රමාණවත් නොවන අතර, කෘෂිකර්ම නිෂ්පාදනය ඉතා පහත් මට්ටමක පවතී. එබැවින් කෘෂිකාර්මික අංශයෙහි ආයෝජන මට්ටම නැංවීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දිරිදීම් මාලාව යටතේ නව දිරිගැන්වීම් පිරිනැමීමට කටයුතු කර ඇත.

## පශු සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා සහ ඉන්දියානු රජයේ හවුල් ව්‍යාපාර මගින් ඉදිරි වර්ෂය තුළදී කිරි නිෂ්පාදනය දෙගුණ කරනු ඇත. මේ ව්‍යාපෘතිය යටතේ පවුල් 10,000කට නව ආදායම් ඉපයීමේ මාර්ග සැලසෙනු ඇති අතර, මේ සංඛ්‍යාව වර්ෂ 5ක් ඇතුළත 30,000 දක්වා ඉහළ යනු ඇත.

## අධ්‍යාපනය හා කුශලතා සංවර්ධනය

එක් අතකින් ශ්‍රම බලකායට එක්වන තරුණයන්ගේ නිපුණතාවනුත්, අනෙක් අතින් සීඝ්‍ර ආර්ථික වර්ධනය ළඟා කරගැනීමට පෞද්ගලික අංශයට අවශ්‍ය වන නිපුණතාවයන් අතරත් නොගැලපීමක් ඇත. මේ නොගැලපීම්වලට පිළියම් යෙදීමට පහත දැක්වෙන පියවර ගනු ඇත :

(i) විෂය මාලාවන්හි අන්තර්ගත දෑ හා ක්‍රමවේදනයන් ප්‍රතිෂ්ඨාපනය කිරීම හා උසස් මට්ටමේ ගුරු පුහුණු වැඩපිළිවෙලක් යටතේ පාසල්වල අධ්‍යාපන මට්ටම උසස් කිරීමට අප පියවර ගනු ලබනු ඇත. ශ්‍රී ලංකා ගුරු සේවය පිහිටුවා රුපියල් මිලියන 3,000කට අධික අතිරේක වියදමක් දරමින් ගුරුවරු ලක්ෂ 2කට අධික සංඛ්‍යාවකගේ වැටුප් මට්ටම් වැඩිකිරීම ගුරුවරුන්ගේ අධ්‍යාපන තත්වය නංවාලීමට ගන්නා ලද අපේ ප්‍රථම අර්ථවත් පියවර විය. දුරස්ථ අධ්‍යාපන වැඩසටහන්, සේවාස්ථ පුහුණු කිරීම් ආදිය මගින් අධ්‍යාපනික ක්ෂේත්‍රයේ කුශලතා නංවාලීමේ වැඩපිළිවෙලවල් ද දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. පාසල් පරිපාලනය වැඩිදියුණු කිරීමේ අරමුණින් විදුහල්පති සේවය ද ප්‍රතිසංවිධානය කරනු ඇත.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

(ii) තාක්ෂණික අධ්‍යාපන ක්ෂේත්‍රයෙහිලා සලකන කළ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ තාක්ෂණික පුහුණු කිරීමේ කටයුතු අර්ථාන්විතව ප්‍රති සංවිධානය කරනු ලැබ ඇත. සේවායෝජකයන්ගේ නූතන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි වෘත්තීය පුහුණු කටයුතු ප්‍රතිෂ්ඨාපනය කෙරෙනු ඇත. පෞද්ගලික අංශයේ සහභාගීත්වය සහිතව පුහුණු කිරීමේ උපදේශක මණ්ඩල පිහිටුවීමට රජය ක්‍රියාකරනු ඇත. කුශලතා සාමාජික අරමුදලක් පිහිටුවීම සඳහා ජාත්‍යන්තර ප්‍රදාන ආයතන සමග දැනට කරගෙන යනු ලබන සාකච්ඡාවලින් සාර්ථක ප්‍රතිඵල අත්කරගැනීම සඳහා රජය දැඩි අධිෂ්ඨානයකින් යුතුව මේ වර්ෂයේ දී ක්‍රියාකරනු ඇත.

(iii) උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහිලා සලකන කළ අ. පො. ස. උසස් පෙළ විභාගයේ සම්පූර්ණ සාමාර්ථය ලබන සිසුන්ගෙන් විශ්ව විද්‍යාලයට ඇතුළු වීමට ඉඩ ප්‍රස්ථා සැලසෙන්නේ සියයට 14කට තරම් අවම සංඛ්‍යාවකට පමණි. මේ සංඛ්‍යාව ගතවූ දශකයේ දී ඉතාම පහත් මට්ටමක පැවතුනි.

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රතිපත්ති අනුගමනය කෙරේ.

දිවයිනේ පළාත්බදව විශ්ව විද්‍යාල පිහිටුවීම කෙරෙහි ප්‍රමුඛතාවය යොමුවී ඇත. 1995 වර්ෂය තුළ අනුරාධපුරය, බලංගොඩ හා අම්පාරේ ඔලුවිල් යන ස්ථානවල නව විශ්ව විද්‍යාල 3ක් පිහිටුවන ලදී.

1994 වර්ෂයේ විශ්ව විද්‍යාල සිසුන් අතුරෙන් නේවාසික පහසුකම් සැලසුනේ සියයට 32කට පමණි. පසුගිය වසර තුළ ද මේ සංඛ්‍යාව සියයට 42 දක්වා වැඩි කරන ලදී. ඉදිරි වර්ෂ 2 තුළ මේ පුහසුකම් සිසුන්ගෙන් සියයට 50ක් දක්වා සංඛ්‍යාවකට ව්‍යාප්ත කිරීමකින් ඉදිරි වර්ෂ 5 තුළ එය සියයට 70 දක්වා

පිරිසකට ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරමු. අධ්‍යාපන තත්ත්වය නංවාලීම හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මේ වසර තුළ රුපියල් බිලියන 17ක් වෙන් කරනු ලැබ ඇත.

## දිළිඳුකම තුරන් කරලීම

දිළිඳුකම තුරන් කරලීම රජයේ සංවර්ධන උපාය මාර්ගයේ වැදගත්ම අංගයකි. පසුගිය වසරේ දියත් කළ ශුභ සාධක වැඩ පිළිවෙල වන සමෘද්ධි ව්‍යාපාරයේ ප්‍රතිලාභ පවුල් දොලොස් ලක්ෂයකට ලැබී ඇත. දිළිඳු ජන කොටස් වෙත මූල්‍ය ආධාර සැපයීමට අතිරේකව එම ජනකොටස් ස්වයං රැකියාවල නියුක්ත අය බවට පත් කිරීමට ද අදහස් කෙරේ. රජයේ කෘෂිකර්ම හා සුළු වාරිමාර්ග වැනි කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපෘතිවල රැකියාවන්හි සමෘද්ධිලාභීන් යෙදවීමට ද පියවර ගනු ඇත. ග්‍රාමීය ප්‍රදේශවල රැකී රක්ෂා අවස්ථා උදාකරලීමේ අරමුණු ඇතිව කෘෂිකර්ම, සත්ව පාලන හා ධීවර හා සුළු කර්මාන්ත අංශවල සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපෘති පිහිටුවීම සඳහා නව සංවර්ධන බැංකුවක් පිහිටුවීමට ද රජය අදහස් කරයි. නිලධාරිවාදයේ බාධක සිඳබිඳ දමමින් ග්‍රාමීය සමාජ සංවර්ධනයේ නියමුවා බවට සමෘද්ධි ව්‍යාපාරය පත් කෙරෙනු ඇත.

## පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය

නැගෙනහිර පළාතේ යුද්ධයෙන් විනාශ වී ගිය ප්‍රදේශවල ද, උතුරු පළාතේ රජයේ පාලනයට නතුව පවත්නා ප්‍රදේශවල ද පුනරුත්ථාපන කටයුතු අරඹා ඇත. නැගෙනහිර පළාතේ සරණාගතයන් නැවත පදිංචි කිරීම මෙන්ම නිවාස ඉදිකිරීම ද අරඹා ඇත.

ජනාධිපති කාර්ය සාධක බලකායන් දෙකක් විසින් මෙම කටයුතු සම්බන්ධීකරණය කරනු ලැබේ.

## ජනවාර්ගික කටයුතු හා ජාතික ඒකාබද්ධතා කටයුතු

විවිධ වාර්ගික හා ආගමික කොටස් එක් කිරීමේ පුළුල් වැඩපිළිවෙලක් අලුතින් පිහිටුවන ලද ජනවාර්ගික හා ජාතික

ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් අරඹා ඇත. විවිධ ජනකොටස් සහභාගී වන සම්මන්ත්‍රණ හා වැඩ මුළු විශාල සංඛ්‍යාවක් මෙමගින් සංවිධානය කර ඇත.

ළමුන් සඳහා වූ විශේෂ වැඩ පිළිවෙළක් පාසල්වල ඇති කරනු ලැබේ.

ක්‍රියාත්මක නොවෙමින් පැවති රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අපි පියවර ගනිමු. රජයේ ආයතනවලට සිංහල හා දෙමළ යන භාෂා දෙකෙන්ම කටයුතු කිරීම පහසු කරනු පිණිස දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීණත්වය ලත් පිරිස් නුදුරු අනාගතයේ දී රාජ්‍ය සේවයට බඳවාගනු ලබනු ඇත.

තවද, ගුරු සේවයේ පුරප්පාඩු සඳහා දෙමළ කතා කරන ගුරුවරු සැලකිය යුතු සංඛ්‍යාවක් බඳවා ගැනීමට පියවර ගනු ලබනු ඇත. එමගින් දෙමළ පාසල් ප්‍රතිසංවිධානය කිරීමටත් පාසල්වල සිංහල හා දෙමළ භාෂා ඉගැන්වීමටත් අපේක්ෂා කෙරේ.

## පරිසමාප්තිය

ගරු කථානායක තුමනි, මගේ රජයට, රාජ්‍ය පාලනයේ වගකීම බාරගන්නා අවස්ථාවේ දී බොහෝ බැරෑරුම් අභියෝගවලට මුහුණදීමට සිදුවිය. එම අභියෝගයන් ලෙස ප්‍රජාතාන්ත්‍රික ආයතන නැවත නගා සිටුවීමට සහ සත්‍ය වශයෙන් ම ක්‍රියාත්මක කරනු ලබන ප්‍රජාතන්ත්‍රවාදයක් ප්‍රතිෂ්ඨාපනය කිරීම, දූෂණය සහ බලය අනිසි ලෙස උපයෝගී කර ගැනීමේ දේශපාලනමය හා පරිපාලනමය ක්‍රියාවලිය පිරිසිදු කිරීම, ඵලදායි නොවන සහ වැතෙන සුළු රාජ්‍ය සේවා නැවත ක්‍රියාත්මක කිරීම සහ උනන්දු කරවීම, වේගවත් ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා පුළුල් ආර්ථික ප්‍රතිසංවිධානයක් සිදුකිරීම සහ ජනවාර්ගික ගැටළුව විසඳීම සඳහා මහා පරිමාණ කාර්ය සාධනයක් ක්‍රියාත්මක කිරීම සහ අපේ ශත වර්ෂයේ ඉතාමත් විනාශකාරී සහ ඉතාමත් ම්ලේච්ඡ යුද්ධය අවසන් කිරීම හැඳින්විය හැක.

අප විසින් මෙම සියළුම අභියෝගයන් බාරගෙන ඇත. විසඳුම් ළඟා කරගැනීම සඳහා සම්ප්‍රදායික ආකල්පයන් බිඳ දැමීමට වුව ද, පසුබට නොවූ අතර, බිය ද නොවෙමු.

විසඳුමක් ඇතිකර ගැනීමේ දී විප්ලවකාරී සහ නව උපාය මාර්ගයන් හඳුන්වාදීමට අපි බිය නොවෙමු.

අපට රටේ පාලනය බාර වූවා පමණක් නොව, නොයෙකුත් දේවල් නිවැරදි මඟකට යොමු කිරීම අප සතු කාර්ය ඉදිරියට ගෙන යාමටත් පෙර කළ යුතු විය.

අපි සාර්ථක ලෙස රාජ්‍ය තන්ත්‍රය නිවැරදි මාර්ගයනට යොමු කර ඇති අතර, ආර්ථික සංවර්ධනයක් ඉදිරියට ගමන් කිරීමට පියවරවල් රැගෙන ඇති බව මට අවංකවම ප්‍රකාශ කළ හැකි වේ.

ජනවාර්ගික ප්‍රශ්න සැළකීමේ දී යුද්ධය අවසන් කිරීම සාර්ථකව කරනු ලබන අතර, ත්‍රෛයි පාර්ශවීය බලය බෙදා හැරීමේ උපාය මාර්ග ජනතාව සමඟ සංවාදයක් මගින් සහ යුද්ධය නිසා බෙදුණු ප්‍රදේශ සංවර්ධන කටයුතු සිදුකිරීම මගින් සාමය සඳහා වූ අපගේ වැඩ සටහන ක්‍රියාත්මක කරනු ඇත.

රජයේ මෙන්ම විරුද්ධ පක්ෂයේ සිටින අය සියල්ලන්ගෙන්ම ජනතාව අපේක්ෂා කරන්නේ අප වැනි කුඩා ජාතියකට දැරිය නොහැකි දැවෙන ප්‍රශ්නවලට පටු සහ පෞද්ගලික කරුණු පසෙක තබා වගකීමෙන් සහ ඥාණාන්විතව විසඳුම් සෙවීමයි.

අපගේ අසීරු අවස්ථාවන්හි දී ජාත්‍යන්තර ප්‍රජාව විසින් අප හට ලබාදෙන ලද අති මහත් සහයෝගිතාවයට මගේ රජයේ සහ ශ්‍රී ලංකාවාසී ජනතාවගේ කෘතඥතාවය පළකිරීමට මම මෙම අවස්ථාව උපයෝගී කර ගනිමි. එය අප තෝරා ගත් මාර්ගයෙහි නොකඩවා ගමන් කිරීමට අවශ්‍ය ධෛර්ය සහ ශක්තිය අප හට ලබාදෙනු ලැබීය.

දකුණේ ජනතාව මෙන්ම උතුරු නැගෙනහිර බහුතර ජනතාව විසින් නොකඩවා අප හට ලබාදෙන ලද විශාල සහයෝගය නිසා අභියෝගයනට මුහුණදී ඒවායින් ජයගැනීමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය සහ විටි අප සතුව ඇති බව අපට විශ්වාසයක් ඇත.

ගරු කථානායක තුමනි, ස්තුතියි.

ජනාධිපති ලේකම් කාර්යාලය
25 AUG 2023

Printed at the Department of Government Printing, Sri Lanka.